''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 60-75

# ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය

**පී. එල්. මෙලනි උපේක්ෂිකා**
සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
melaniupekshika@gmail.com

**සංක්ෂේපය**
යෝනි සුන්නත්කරණය, ස්ත්‍රී ලිංග ඡේදනය, ස්ත්‍රී චර්ම ඡෙදනය ආදී විවිධ නම්වලින් හැඳින්වෙන ස්ත්‍රීන්ගේ ලිංගික අවයව කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම කපා ඉවත් කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය නමින් හැඳින්වේ. ලොව පුරා කාන්තාවන් බොහොමයකට තම ශරීර අයිතිය පවා අහිමි කරන මෙම ක්‍රියාවලිය හේතුවෙන් දිනෙන් දින ඉහළ යන මරණ සංඛ්‍යාවද ඉහළ අගයක් ගනී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය හේතුවෙන් කාන්තාවට වන බලපෑම අධ්‍යයනය කිරීම වන අතර, සෙසු අරමුණු වශයෙන් ස්ත්‍රී ජනනේද්‍රීය ඡේදනයේ වර්තමාන ස්වභාවය අධ්‍යයනය කිරීම, එහි ව්‍යාප්තිය හඳුනාගැනීම හා ස්ත්‍රී ජනනේද්‍රීය ඡේදනයේ අහිතකර බලපෑම් අවම කිරීමට හා වැළැක්වීමට යෝජනා ඉදිරිපත් කිරීම පෙන්වාදිය හැකිය. ද්විතීයික දත්ත උපයෝගී කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කළ අතර මූලාශ වශයෙන් ස්ත්‍රී ජනනේද්‍රීය ඡේදනය සම්බන්ධ මෑතකාලීන සංඛ්‍යාලේඛන, පොත්පත්, සඟරා සහ පර්යේෂණ ලිපි උපයෝගීකොට ගන්නා ලදී. සාම්ප්‍රදායික ආරම්භයක් සහිත ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය ලොව පුරා මුල් බැසගත් ක්‍රියාවලියක් වී ඇත. ඒ තුළින් ලොව පුරා කාන්තාවන් සහ ගැහැනු ළමුන් ලක්ව ඇති අහිතකර බලපෑම් රාශියක් අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය. ඒ අතර ලිංගාශ්‍රිත ශරීර කෘත්‍යන් සිදුකරගැනීමේ අපහසුතා හා වේදනා ඇතිවීම්, අධික ලෙස රුධිරය පිටවීම හේතුවෙන් වන මරණයට පත්වීම්, ලිංගික තෘප්තිය අහිමිවීම හා ඒ හේතුවෙන් වන මානසික ආතතිය ඉන් කිහිපයකි. ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ ඇති අතාර්කික පදනම පුද්ගල මනසින් ඉවත් කිරීමට කටයුතු සම්පාදනය කිරීම, මෙම ක්‍රියාවලිය හේතුවෙන් ස්ත්‍රියට වන බලපෑම සමාජගත කිරීම, මෙම පදනම් විරහිත ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන නීතිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ ඇති අවශ්‍යතාවය යල්පැනගිය සහ අසාධාරණ ක්‍රියාවලියක් බව අනාගත පරම්පරාවට ඒත්තුගැන්වීම අධ්‍යයනය අවසානයේ ඉදිරිපත් කළ යෝජනා අතර වෙයි.

**මුඛ්‍ය පද:** ගැහැනු ළමුන්, ස්ත්‍රිය, ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය

## හැඳින්වීම

ලිංගභේදය ස්ත්‍රීත්වය හා පුරුෂත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පද සමාන අර්ථ ඇති පද ලෙස පුද්ගලයින් විසින් බොහෝ අවස්ථාවල භාවිත කරනු ලැබේ. ස්ත්‍රී පුරුෂ ලිංගභේදය යන පදයට වඩා ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය සමාජීය මෙන් ම මනෝභාවාත්මක වශයෙන් ද වෙනස් වූ අර්ථයක් ගෙන දෙයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධව ගෝලීය වශයෙන් පිළිගත් විශ්වීය මතයක් හඳුනාගත නොහැකිය. තවද, ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව හා වටිනාකම් විශ්ලේෂණය කළ යුත්තේ ඒ ඒ සමාජ කණ්ඩායම මත පදනම් වූ දෘෂ්ටිකෝණයෙනි (අන්කුඹුර ,2018, පි8).

ස්ත්‍රී පුරුෂ ලිංගභේදය යනුවෙන් සරලව හඳුන්වන්නේ උපතින් ම හිමිවන ලිංගික භාවයෙහි වෙනසයි. ජීව විද්‍යාත්මකව ස්වභාවයෙන් සියලු ම ජීවීහු ස්ත්‍රී පුරුෂ යන බෙදුමට ලක්ව උපත ලබති. ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇති මෙම ජීව විද්‍යාත්මක ලිංගික වෙනස හේතුවෙන් ඔවුනොවුන්ගේ අඟපසඟ ඉන්ද්‍රියන් හා ශරීර වර්ධනය වෙනස් අයුරින් සිදු වෙයි. ස්ත්‍රීන්ගේ හා පුරුෂයින්ගේ ශරීර වර්ධනයේ දී ඉන්ද්‍රියන්ගේ බාහිර මෙන් ම අභ්‍යන්තර වෙනස්කම් ද සිදුවන අතර, කටහඬ වැනි දෑ පවා වෙනසකට භාජනය වෙයි. මෙම ලිංගික වෙනස ස්භාවිකව ම නිර්මාණය වූ ජීව විද්‍යාත්මක වෙනසකි. මෙය සමස්ත ලෝකයට ම පොදු වූ දෙයකි. කවර රටක, කවර සමාජයක වුවද, වසර දහස් ගණනකට පෙරාතුව වුවද නූතන යුගයේ දී වුවද, මෙම ස්ත්‍රී පුරුෂ ලිංගික වෙනස නොවෙනස්ව පවතියි.

ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ වෙනස් වූ සමාජ තත්වයන් මෙම දෙපක්ෂය සඳහා නිර්මාණය කර දී ඇත. සමාජය හා සංස්කෘතිය මගින් මෙම බෙදීම සිදුකර තිබෙන අතර සෑම ඒකකයකදී මෙන් ම සෑම ස්ථරයකදී ම එය දක්නට ලැබේ. ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින් ම නිර්මාණය කර තිබේ. මෙම සමාජ නිර්මිතය සමාජයෙන් සමාජයට රටින් රටට වෙනස් වේ. මානව වර්ග, ජාති, කුල, ප්‍රදේශ අතර ද, සමාජ සංස්කෘතික වෙනස්කම් අනුව ද, සිදු වේ (https://moshiaratuwa1993.blogspot.com).

ස්ත්‍රිය සම්බන්ධ සෘණාත්මක ආකල්ප අතීතයේ පටන්ම සාමාජය තුළ මුල් බැසගෙන පැවති බව පෙනේ. ග්‍රීක ජාතීන් අතර ස්ත්‍රීන් වෙළඳ භාණ්ඩයක් ආකාරයට පිළිගනු ලැබූණි. එහිදී ඔවුන්ට කිසිදු අයිතිවාසිකමක් හිමි නොවූණි. සියලු අයිතිවාසිකම් හිමි වූයේ පිරිමින්ටය. තව ද, ඔවුන්ට සම්පත් කෙරෙහි වූ දෙවෙනි උරුමය ද, මුදල් පරිහරණය කිරීමේ අයිතිය ද තහනම් වශයෙන් පැවැත්විණ. ඔවුන්ගේ ප්‍රකට විද්‍යාඥයා වූ සොක්‍රටීස් විශ්වයේ භයානක විනාශයට ස්ත්‍රීන් හේතු වන්නේය, ස්ත්‍රිය බාහිරයෙන් සෞන්දර්ය අලංකාරයෙන් යුත් විෂ ගසකට සමාන වන්නේ ය, එබැවින් එම ගසෙන් යම්කිසි දෙයක් අනුභව කරන පක්ෂීන් ඒ විගස ම මැරුම් දකිති. යනුවෙන් අදහස් පළ කර ඇත.

රෝම ජාතීන් ස්ත්‍රිය පණ නැති වස්තුවක් සේ සිතූහ. ඔවුන් අතර ස්ත්‍රියට වටිනාකමක් හෝ අයිතිවාසිකමක් හෝ හිමි නොවීය. ස්ත්‍රීන් පණ නැති දෙයක් ලෙස සැලකීම හේතුවෙන් ඔවුන්ගේ ශරීරය මත උණුකරන ලද තෙල් වක්කරමින් ද, කුළුණු මත බැඳ තබමින් ද වදහිංසා කළහ. මෙපමණක් නොව කිසියම් වරදක් නොකළ ස්ත්‍රීන් ද අශ්වයන්ගේ වලිගයෙහි බැඳ ඔවුන් මරණය දකින තරමට වේගයෙන් පදවන්නට වූහ.

ස්ත්‍රීන් පිළිබඳ ඉන්දියානුවන්ගේ බැල්ම ද මෙසේ පැවැත්විණ. කාන්තාව තම සැමියා නැසී ගියේ ද, ඔහුගේ චිතකයේ ම ඔහුගේ බිරිද දවන්නට වූහ. තව ද චීන වැසියන් ස්ත්‍රීන් තම සෞභාග්‍ය හා සම්පත් විනාශ කරන්නන් ලෙස සැලකූහ. ඔවුන්ට තම බිරියන් පණ පිටින් වැළලීමේ හා විකිණීමේ අයිතිය ද හිමි විය.

යුදෙව්වරුන් ස්ත්‍රීන් සාපයට ලත් වූ අය ලෙස හැඳින්වූහ. ඇය නබි ආදම් තුමා අයහමගට යොමුකොට තහනම් කළ ගසෙන් අනුභව කිරීමට මග පෙන්වූ බවත්, ස්ත්‍රිය ඔසප් වූ විට ඇය අල්ලන දේ ද, නිවස ද කිළිටි කරන අපිරිසිදු වන්තියක ලෙසත් සිතූහ. තව ද, ඇයට සහෝදරයන් සිටියේ ද ඇයට තම පියාගේ ධනයෙන් කිසියම් හිමිකමක් නොලැබෙන බව ද දැක්වූහ.

ක්‍රිස්තියන් ජාතීහු ස්ත්‍රීන් ෂෙතාන් (යක්ෂයන්) ලෙස සිතූහ. ක්‍රිස්තියානි ආගමික උගතෙකු "ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත් නොවන්නන්" බව පැවසීය. තව ද ශුද්ධ භූනා වෙන්ටූර් නැමැත්තා "ඔබ ස්ත්‍රියක් දුටුවේ නම්, ඇය මිනිස් ජාතියට අයත් නැත්තා හෝ පණ ඇති දෙයක් ලෙස හෝ නොසිතන්න. නියත වශයෙන් ම ඔබ දකින්නේ යක්ෂයාගේ රූපය බවත්, ඔබලා අසා සිටින ඇයගේ කටහඬ සර්පයා ගොරවන ශබ්දය බවත්" පවසන්නේ ය.

19 වන සියවස මැද භාගය තෙක් ඉංග්‍රීසි සාමාන්‍ය නීතිය අනුව ස්ත්‍රීන් ප්‍රජා අයිතිය ලද අය ලෙස නොසැලකිණි. 1567 වන වසරේ ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව "ස්ත්‍රීන්ට යම්කිසි දෙයකට බලයක් නොදිය යුතුයි" යනුවෙන් නීතියක් පැනවීය. අටවන හෙන්රි රජුගේ කාලයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව " ස්ත්‍රීන් අපිරිසිදු අය බැවින් බයිබලය පරායනය නොකළ යුතුයි." යනුවෙන් නීතියක් සම්මත කළේ ය. ප්‍රංශ ජාතීන් "ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත් ද නැද්ද යන්න"තීරණය කිරීම සඳහා සමීක්ෂණයක් කිරීමට කමිටුවක් පත් කළහ. ඔවුහු ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත් වූ නමුත්, ඔවුන් මවන ලද්දේ පිරිමින්ට ආවතේව කිරීම සඳහා බව තීරණය කළහ. වර්ෂ 1805 දක්වා ඉංග්‍රීසීන්ගේ නීතිය අනුව සැමියෙකුට තම බිරිඳ විකිණීමේ අයිතිය තිබිණ. තව ද, බිරිඳගේ වටිනාකම පැන්ස හයක් එනම් සිලින් භාගයක් යනුවෙන් නිගමනය කළහ(බින් සාලේ, 2008, පි3-4).

මේ ආකාරයට වෙන්කොට සැලකීම් අතීත සමාජයේ සිට ම කාන්තාව විෂයෙහි ක්‍රියාත්මක වූ අතර, සමස්ත මානව අයිතිවාසිකම් පවා ඇයට හිමි නොවූ තත්ත්වයක් උද වී තිබුණි. මේ අයුරින් අතීත සමාජ තත්වය කාන්තාවට හිමිවෙද්දී කාන්තාව පිළිබඳ මානුෂීය කතිකාවන් ආරම්භ වීම කල්යත් ම සිදු විය. මේ තුළ කාන්තා අයිතිවාසිකම් දිනාගැනීමේ අරගලය ආරම්භ වූ අතර, පුරුෂයින් විසින් භුක්තිවිඳින ලද වරප්‍රසාද විශාල ප්‍රමාණයක් කාන්තාවට අහිමිව ගොස් තිබීම මෙම අරගල ඇති වීමට ප්‍රධාන හේතු සාධක විය (https://rora.media.com).

කාන්තාව සම්බන්ධයෙන් වර්තමානයේ කෙතරම් කතාබහට ලක් වුව ද, රජය මගින් හා නොයෙකුත් රාජ්‍ය නොවන සංවිධාන හා ස්වෙච්ඡා සංවිධාන කාන්තාව සම්බන්ධයෙන් විවිධ නීති රීති හා සම්මුතීන් ඉදිරිපත් කළ ද, වර්තමානයේ පවා පුරුෂයාට සාපේක්ෂව කාන්තාව දැඩි පීඩනයකට ලක්වන බව නොරහසකි. මෙය විවිධාකාරයෙන් සිදුවන අතර, ආසියානු හා අප්‍රිකානු කලාපවල කාන්තාවන් මෙම තත්ත්වයන්ට බහුලව ගොදුරු වේ.

- ස්ත්‍රී දූෂණය
- මිනිස් වෙළඳාම
- ළමා විවාහ
- ස්ත්‍රී චර්ම ඡේදනය
- ශ්‍රමය සූරාකෑම
- ලිංගික වහලුන් ලෙස සේවයේ යෙදවීම
- අමානුෂික දඬුවම්

කාන්තාවන්ට සිදුවන අසාධාරණ අමානුෂික ක්‍රියාවලීන් අතර ප්‍රමුඛ තැනක් ගනී (https://rora.media.com).

මේ අතර සුන්නත්කරණය කාන්තාවන්ට පමණක් සිදු කරන ක්‍රියාවලියක් නොවූවත් එය සිදුකිරීමේ පිළිවෙත හා එහි ප්‍රතිඵල භුක්ති විඳීමේ දී, වැඩිම බලපෑමකට සහ කෲර වද හිංසනයකට ලක් වන්නේ කාන්තාවන් වේ. සුන්නත් කිරීම සම්බන්ධයෙන් තහවුරු කරගත් ලිඛිතමය සාධක ඉස්ලාම් ආගමේ එන "හදීත්" නම් කෘතියේ සඳහන් වේ. ස්ත්‍රී චර්මඡේදනය හා ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය යනු අර්ථ දෙකක් ඇති වචන දෙකක් ලෙස මොවුන් දක්වයි.

"උම්මු අතියියා, ඔබ චර්මඡේදනය කරන විට ඉතා කුඩා කොටසක් පමණක් කපන්නට සීමා කරන්න. අභිශිෂ්ණිකා මුණ්ඩය ඉවත් කිරීමට කටයුතු නොකරන්න. මෙය ස්ත්‍රියට (බිරිඳට) ප්‍රසන්න වූ ද, පුරුෂයාට තෘප්තිකර වූ ද වන්නේය"(තබරානිඃ දෙවන වෙළුම හදීස් අංක 772).

මේ අනුව ඔවුන් ප්‍රකාශ කර සිටින්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්වචනය කරන ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය ඉස්ලාම් ආගමෙන් අනුමතකර නොමැති බවයි.

කුමන ප්‍රභවයක් සහිත වූවක් වුවත්, මේ සියළුම ක්‍රියාවලින් සිදුවන්නේ ස්ත්‍රීන්ගේ ලිංගික කොටස්වලට හානි පැමිණ වීමයි. මේ කුමන කරුණක් පදනම වුව ද, ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය ලොව පුරා කාන්තාවන්ට අත් කරන්නේ ඛේදනීය ඉරණමකි. තම ජීවිත කාලය පුරාවට ම වේදනාකාරී අත්දැකීම් සමූහයක් තම ස්ත්‍රීත්වය මත කරතබාගනිමින් තම ශරීර අයිතිය වෙනත් අයෙකු විසින් විනාශ කරන තෙක් බලා සිටීමට සිදුවන කාන්තාවන් හා කුඩා ගැහැනු දරුවන් අදටත් ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය නම් මෙම ක්‍රියාවලියට ගොදුරු වෙමින් සිටිති. ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය දක්වන ආකාරයට,

"වෛද්‍ය ප්‍රතිකාරයක් වශයෙන් හෝ විශේෂයෙන් යුදෙව් දහමේ සහ ඉස්ලාම් ආගමික කටයුත්තක් ලෙස හෝ (තරුණ පිරිමියෙකුගේ හෝ කුඩා දරුවෙකුගේ) ලිංගාග්‍ර චර්මය කපා ඉවත් කිරීම, සාම්ප්‍රදායික ක්‍රියාවක් ලෙස ගැහැනු දරුවෙකුගේ හෝ ස්ත්‍රියකගේ අභිශිෂ්ණිකාව (Clitoris) කපා ඉවත් කිරීම සහ ඇතැම් අවස්ථාවන්හි අධරය (Labia) යෙන් ද කොටසක් කපා ඉවත් කිරීම"

මෙම නිර්වචනය සම්බන්ධයෙන් ඉස්ලාම් විද්වතුන් විරෝධය පල කරන්නේ ඉහත සඳහන් කළ කරුණ පාදක කරගනිමිනි. නමුත් පුරුෂ සුන්නත්කරණය පිළිබඳව බහුතරය දැනුවත්භාවයකින් සිටියත්, ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය පිළිබඳව අවධානය යොමුවන්නේ මෑතකාලීන යුගයේදීය. ඊට හේතුව වන්නේ තම සම්ප්‍රදයට වහල් වෙමින් කාන්තාවන් සිය වේදනාව ඉවසා දරා සිටීම විය හැකිය. මෙතෙක් පවත්වාගෙන ආ චාරිත්‍රයට පටහැනිව ක්‍රියා කිරීම හේතුවෙන් අදාළ සමාජයෙන් කොන් වීමකට ලක්වෙතැයි බියෙන් සුන්නත්කරණය කිරීමට බොහෝ සෙයින් යොමු වේ.

### අධ්‍යයනයේ අරමුණු

#### ප්‍රධාන අරමුණ

ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය හේතුවෙන් කාන්තාවට වන බලපෑම අධ්‍යයනය කිරීම.

#### සෙසු අරමුණු

ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයේ වර්තමාන ස්වභාවය අධ්‍යයනය කිරීම.

ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයේ ව්‍යාප්තිය හඳුනාගැනීම.

ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයෙ හේතුවෙන් වන අහිතකර බලපෑම් අවම කිරීමට හා වැළැක්වීමට යෝජනා ඉදිරිපත් කිරීම කිරීම.

### සාකච්ඡාව

ස්ත්‍රී ලිංගික අවයව ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදන ක්‍රියාවලියේ මූලික භෞතික සාධක වන අතර, ස්ත්‍රී ලිංගික අවයව පහත පරිදි වේ.

- භගීය අධරය (Labia majora)
- කණිය අධරය (Labia minora)
- භගමණිය (Clitoris)
- යෝනි මාර්ගය (Vagina)
- මුත්‍රාමාර්ගය (Urethra)

(https://mahakalusinhalaya.wordpress.com).

කාන්තා සුන්නත්කරණය, ස්ත්‍රී චර්මඡේදනය, ස්ත්‍රී ලිංග ව්‍යවච්ඡේදනය, යෝනි සුන්නත, යන සියළු නම්වලින් හැඳින්වෙන්නේ ස්ත්‍රියගේ ලිංගික අවයවවලට කිසියම් හෝ ආකාරයේ හානි පැමිණවීමක් වේ. මෙහි දී එක්සත් ජාතීන් විසින් සාර්ව ලෙස පිළිගත් වචනය වන්නේ ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය යන්නයි. ඉංග්‍රීසි භාෂාවෙන් මෙය Female genital mutilation (FGM) ලෙස හැඳින්වේ.

අරාබිකරයේ හා අප්‍රිකානු රටවල අවුරුදු 400ක් පමණ තරම් පැරණි චාරිත්‍රයක් ලෙස හැඳින්වෙන ස්ත්‍රී චර්මඡේදනය විශාල වශයෙන් ව්‍යාප්ත වී තිබෙන්නේ අප්‍රිකාවේ නැගෙනහිර, බටහිර, වයඹ යන ප්‍රදේශවලය. මීට අමතරව වර්තමානය වන විට ආසියා හා මැදපෙරදිග රටවල මෙන් ම ඇමරිකාවේ හා බටහිර රටවල පදිංචියට පැමිණි සංක්‍රමණිකයන් අතර ද මෙම චාරිත්‍රය දක්නට ලැබේ. ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය කවද, කොතැන, කෙසේ ආරම්භ වූයේ දැයි නිශ්චිත නොවේ. එය ක්‍රිස්තියානි හා ඉස්ලාම් භක්තිකයින් අතර මූලික වශයෙන් හටගත් බවට ඇතැම් සාක්ෂි ඉදිරිපත් වී ඇති බව පැවසේ. (https://saruwapittala.blogspot.com).

ඇතමුන් දක්වන ආකාරයට ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය ආරම්භ වන්නේ පුරාණ ඊජිප්තුව තුළින් වේ. ඊජිප්තුව තුළ පුද්ගලයෙක් මිය යාමෙන් අනතුරුව පිළිස්සීමකින් හෝ වළදැමීමකින් තොරව බෙහෙත් ගැල්වූ මමියක් ලෙස තැන්පත් කිරීම සිදු කරනු ලබයි. මේ වන විට මමි පිළිබඳව බොහෝ වියතුන් පුරා විද්‍යාඥයින් පවා කැණීම් සිදුකිරීම හේතුවෙන් මෙම කාන්තා මමිවල ස්ත්‍රී චර්මඡේදනයේ ලක්ෂණ දක්නට ඇති බවත්, ඇතැම් සිතුවම් හා මූලාශ්‍රයන්හි ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ යම්කිසි ප්‍රමාණයක ඉඟි සහ සලකුණු ලැබෙන බවත් සඳහන් වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, "යෝනි සුන්නත (Female genital mutilation) යනු කාන්තා ප්‍රජනන ඉන්ද්‍රියන්ට තුවාල සිදු කෙරෙන වෛද්‍යමය උවමනාවකින් තොරව සිදුකෙරෙන ක්‍රියාවලියකි"

මෙහිදී, ස්ත්‍රීන්ගේ බාහිර ලිංගික අවයව සම්පූර්ණයෙන් ම කපා දැමීමක් හෝ කොටසක් කපා දැමීමක් සිදු කරයි. මෙය බොහෝ රටවල සාම්ප්‍රදායික කාර්යයක් ලෙස සිදු කරනු ලබන අතර, කාන්තාවන්ගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්වල දී සිදු කරනු ලබයි.

- ළමා කාලයේ දී
- වැඩිවියට පත් වූ පසු
- විවාහ වී ප්‍රථම දරු උපතට පසු

යන අවස්ථාවන්හි දී ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය සිදු කරයි. මෙම ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය සිදුකරන වයස් සීමාව සමාජයෙන් සමාජයට වෙනස් වේ. එය බොහෝ විට අවුරුදු 14-16 කාලයේ දී සිදු කරනු ලබයි. නමුත් බොහෝ සමාජ ක්‍රමවල එය අවුරුදු 4ක් තරම් කුඩා අවධියේ දී පවා සිදු කරනු ලබන බවට වාර්ථා වේ (https://life.lk).

රූපය 1: කුඩා දැරියකගේ යෝනි සුන්නත සිදු කරන ආකාරය



(https://rora.media.com).

විවිධ හේතූන් මුල්කොට ගනිමින් දෙමාපියන්ගේ කැමැත්ත මත මෙය සිදු කරනු ලබන අතර,

- කාන්තාව ලිංගිකව හැසිරීම සීමා කිරීම
- විවාහයට පෙර කන්‍යාභාවය අහිමි කර ගැනීම වැළැක්වීම
- කාන්තාවන්ගේ ලිංගික තෘප්තිය සීමා කිරීම
- ලිංගිකව එක්වීමේ දී පුරුෂයාට උපරිම තෘප්තියක් ලබා දීම
- ස්ත්‍රීන්ගේ අපිරිසිඳු ශරීර කොටසක් පවිත්‍ර කිරීමට ස්ත්‍රී චර්මඡේදනය සිදු කරන බවත් එය දෙවියන් වහන්සේ විසින් ඉල්ලා සිටින්නක් බවටත් ප්‍රකාශ කරයි.

මෙකී දරුණු වේදනාවට ගැහැණු දරුවන් මුහුණ දෙන්නේ එකළ සමාජයේ මුල්බැසගෙන තිබූ මිත්‍යා මත හේතුකොට ගෙනය.

- කාන්තාවගේ භගමනිය නොකැපුවහොත් එය පුරුෂ ලිංගයක් මෙන් වර්ධනය වන බව
- ලිංගික අවයව කැපීම මගින් දරුවන්ට නොමැරී ජීවත් වීමේ හැකියාව ලැබෙන බව
- එමගින් සුන්දරත්වය ඇතිවන බව
- කාන්තාව පිරිසිදු වන්නේ ස්ත්‍රී චර්මඡේදනයෙන් පසුව බව
- ගැහැණු දරුවෙකු කාන්තාවක් බවට පත් වන්නේ ස්ත්‍රී චර්මඡේදනයෙන් පසුව බව
- ඇය විවාහයට සුදුසු වන්නේ මෙම චාරිත්‍රයෙන් පසුව බව

ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය සිදුකිරීම සඳහා නිශ්චිත වූ පුද්ගලයෙක් හෝ වෛද්‍ය උපකරණ නොමැත.

- වින්නඹු කාන්තාවන්
- කරණවෑමියන්
- කාන්තා නෑදෑයන්
- සාම්ප්‍රදායික වෛද්‍යවරුන්
- අභිකුණ්ඨක කාන්තාවන්

විසින් මෙම ක්‍රියාවලිය සිදු කරනු ලබයි. නමුත් මොවුන්ට ඒ සඳහා කිසිඳු පදනමක් නොමැති අතර ක්‍රියාව සිදු කිරීමෙන් ලබන අත්දැකීමක් පමණක් පවතී. මොවුන් මේ ක්‍රියාවලිය නිතර සිදු කරන නිසාම ඔවුන්ට ඒ සම්බන්ධව කිසිඳු තැකීමක් නොමැති බව සිතිය හැකිය. එමෙන් ම ඔවුන් මෙම ක්‍රියාවලිය සිදුකරන්නේ කිසිඳු මානුෂීය හැඟීමකින් තොරව බව සිදුවීම් වලදී අනාවරණය වේ. කිසිඳු අරක්ෂිත ක්‍රමවේදයක් මේ සඳහා යොදා නොගැනේ. ස්ත්‍රී ජනනේද්‍රීය ඡේදනය සඳහා යොදගනු ලබන උපකරණ කිසිඳු සෞඛ්‍යාරක්ෂිත බවක් තහවුරු කරන ලද ඒවා නොවේ. පහසුවෙන් සපයාගත හැකි මෙම ආයුධ දීර්ඝ කාලයක් තිස්සේ එකම ක්‍රියාවලිය සඳහා යොදගන්නා ලද ඒවා වේ. එමෙන් ම එක් අයෙකුගේ ඉන්ද්‍රියන් ඡේදනයෙන් අනතුරුව බොහෝ විට එය පිරිසිදු කිරීමකින් තොරව අනෙක් තැනැත්තාගේ අවයව ඡේදනය සඳහා ද යොද ගන්නා බව කියැවේ.

රූපය 2: ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය සිදුකරන උපකරණ

මේ සඳහා,

- පිහි
- කතුරු
- වීදුරු කැබැලි
- බ්ලේඩ්
- දැලි පිහි
- ගල් පතුරු
- ඉදිකටු



(https://rora.media.com).

ආදිය භාවිත කරනු ලබයි. ඇතැම්විට මේවා බොහෝ සෙයින් මල බැඳුණු ඒවා වේ. ජීවානුහරණය පවා නොකරන මේ උපකරණ වලින් ශරීරයේ ඉතාම සියුම් කොටස් කපා දැමීම කෙතරම් වේදනාකාරී හා අනාරක්ෂිත අත්දැකීමක් වනු ඇති දැයි සිතිය හැකිය.

ලිංගික කොටස් කපා දැමීමේ දී කිසිඳු ආකාරයන නිර්වින්දනයක් සිදු නොකරන අතර, එම කපාදැමීමෙන් අනතුරුව කිසිඳු වේදනා නාශකයක් හෝ ලබා නොදෙයි. රුධිරය අධික ලෙස පිටවීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ සාම්ප්‍රධායික අත් බෙහෙතක් පමණක් ලබා දෙනු ලබයි.

රූපය 3: ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයෙන් සිදු කිරීමෙන් අනතුරුව තුවාලයේ ගල්වන අත්බෙහෙත්



(https://rora.media.com).

තුවාලය සුව කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගැහැනු ළමයෙකුගේ කකුල් දෙක සති දෙකක් හෝ හයක් අතර කාලයක් එකට එක්කර බැඳ තබයි.

රූපය 4: ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයෙන් අනරුතුව තුවාලය සුව වන තෙක් කකුල් එකට ගැටගසා තිබෙන ගැහැනු ළමයෙක්



(https://rora.media.com).

සුවපත් කළ පසු ඇයගේ කකුල් අතර නොගැලවූ සම තට්ටුවක් ඉතිරි වී ඇත. මුත්‍රා හා ඔසප් චක්‍රය ක්‍රියාත්මක වීමේ දී රුධිරය නිකුත් කිරීම සඳහා පත්ලේ කුඩා විවරයක් පමණක් ඉතිරි කරනු ලබයි (https://si.approbby.com). මෙය ඉතා වේදනාකාරී ක්‍රියාවලියකි. ඇතැම් දරුවන්ට මුත්‍රා පිටකිරීමට හා ඔසප් රුධිරය පිට කිරීමට මෙම විවරය ප්‍රමාණවත් නොවේ. එහි දී සිදු කරනු ලබන්නේ පිහියක් වැනි යමක් ගෙන එය තරමක් විශාල කිරීම වේ. මෙය කාන්තාවන්ට දැරිය නොහැකි වේදනා ගෙන දෙන අමානුෂික ක්‍රියාවලියක් බව වැටහේ. එමෙන් ම මිනිස් ජීවිතයකට මෙතරම් අනාරක්ෂිත බවක් දැක්විය හැකිද යන්න මානුෂීය ගැටළුවකි. එපමණක් නොව, වෛද්‍ය විද්‍යාව කිසිඳු නිර්දේශයක් නොකරන මෙම ක්‍රියාවලිය දිනෙන් දින ඉහළ යාම ගැටළුකාරී තත්ත්වයක් වී ඇත.

මෙය මූලිකම වශයෙන් අප්‍රිකානු රටවල් වලින් ආරම්භ වන්නට ඇතැයි හඳුනාගනු ලැබුවද මෙහි ව්‍යාප්තවීමක් දකගත හැකි වීම වඩා බරපතල තත්ත්වයකි. මැදපෙරදිග ආසියානු රටවල්, ඇමරිකානු මහද්වීපයේ රටවල් මෙන් ම ඉතාලිය, ඩෙන්මාර්කය, ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය වැනි රටවල පවා මෙම ක්‍රියාදාමය සිදුවන බවට තොරතුරු වාර්තා වී තිබේ. ඇමරිකාව කෙතරම් දියුණු රටක් වුව ද, ඇමරිකා එක්සත් ජනපදයේ පවා වසරකට 10,000 ක් පමණ ගැහැණු දරුවන් මෙම ඛේදනීය තත්ත්වයට මුහුණදේ. ඇමරිකානු හා අප්‍රිකානු රටවල් 30ක පමණ මේ ගතවන මොහොතේදීත් ස්ත්‍රී චර්මඡේදනය සිදුවන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශ කර සිටී (https://bbc.com).


**ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්ගීකරණය**

ස්ත්‍රී සුන්නත්කරණය නැතහොත් ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය සිදු කරන ආකාරය අනුව ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) එය වර්ග කිරීමක් සිදුකොට ඇත.

**භගමනිය කපා ඉවත් කිරීම (Clitoridectomy)**

මෙමගින් සිදු කෙරෙන්නේ භගමණියේ සංවේදී කොටස් සහ අවට චර්මය අර්ධ වශයෙන් හෝ සහමුලින්ම කපා ඉවත් කිරීමයි.

රූපය 5: භගමනිය කපා ඉවත් කිරීම





(https://m.facebook.com)

**විච්ඡේදනය (Excision)**

භගමණිය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම කපා ඉවත් කිරීමත් සමඟ බාහිර අධර (තොල්) සිඳ දැමීම හෝ යෝනිය ආශ්‍රිත අභ්‍යන්තර චර්ම රටා සිඳ දැමීම වේ.

රූපය 6: විච්ඡේදනය





(https://m.facebook.com)

**ලිංගාවරණය (Infibulations )**

ලිංගිකව හැසිරීම වළක්වාලීමට භගමණිය සිඳ යෝනි අධර (තොල්) මසා දැමීම මෙහිදී සිදු කරයි.

රූපය 7: ලිංගාවරණය




(https://m.facebook.com)

**විවිධ හානි පැමිණවීම (Causing various damages)**

අනෙකුත් සියළුම ආකාරයෙන් සිදු කරන ලිංගික අවයව ඡේදනය කිරීම් මෙයට අයත් වේ. භගමණිය හෝ යෝනි ප්‍රදේශය ගිනියම් කළ ආයුධවලින් පිළිස්සීම, භගමණියට ඉදිකටු හෝ කුරුවලින් ඇනීම, හිල් කිරීම, යෝනිය කැපීම, ඇදීම, ඡේදනය, යෝනි විවරය අවට සම සීරීම සිදුරු කිරීම, යෝනිය ඉරීම හා ලේ ගැලීමට හෝ විවෘත්තවීමට ඉඩක් නැතිවීම සඳහා යෝනිය තුළට විවිධ දේවල් ඇතුළත් කිරීම ආදී වේදනාකාරී අංග මෙම ක්‍රමයට අයත් වේ.

මීට අමතරව වෙනත් වර්ගීකරණයන් දැකිය හැකි අතර, ඒවා සියල්ල මෙම වර්ග හතර යටතට වැටෙන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශ කර සිටී.

රූපය 8: විවිධ හානි පැමිණවීම




**ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය සිදුකිරීමේ ප්‍රතිඵල**

සැබවින්ම මෙම ක්‍රියාවලියේ හිතකර ප්‍රතිඵල තිබෙනවාද? නැද්ද? යන්න ප්‍රශ්න කිරීම පවා යුක්තිසහගත නොවේ. ඔවුන් බලාපොරොත්තුවන පිරිසිදු බව මැනීමට මෙය මිනුම්දණ්ඩක් ලෙස යොද ගැනීම අයුක්ති සහගත බව ගෝත්‍රික මානසිකත්වය නොමැති ඕනෑම පුද්ගලයෙකුට වැටහේ. එමෙන් ම මෙම ක්‍රියාවලිය සිදු කිරීමෙන් දෙවියන් සතුටු වූවාද නැද්ද යන්න පවා ඔවුන් මේ වන තුරු නොදනී. කෙසේ වුව ද, කාන්තා ශරීර අයිතිය අහිමි කරන මෙම ක්‍රියාවලිය ජීවිත කාලය පුරාවට ම කාන්තාවට ස්ත්‍රීත්වය එපා කරවන්නක් වනු නිසැකය. ඒ තුළ කාන්තාව භෞතික මෙන් ම මානසික වශයෙන් වන පීඩාව මෙතෙකැයි කිව නොහැකිය. තම සම්ප්‍රධාය ආරක්ෂා කිරීමට ගොදුරුවීම හේතුවෙන් ඇය ලබන අවාසි සහගත තත්ත්වයන් සඳහන් පරිදි වේ.

වගුව 1: ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ බලපෑම

| භෞතික බලපෑම | මානසික බලපෑම |
|---|---|
| පාලනය කළ නොහැකි ලේ ගැලීම<br>මුත්‍රාශයට හානි වීම හා ඒ ආශ්‍රිත අබාධ<br>ඔසප් වීමේදී ඇතිවන වේදනාව හා ඒ ආශ්‍රිත රෝග<br>ප්‍රජනක පද්ධතියේ පටක ඉදිමීමට ලක් වීම<br>ලිංගික සංසර්ගයේදී සිදුවන බරපතල වේදනාව<br>දරු ප්‍රසූතියේ දී සිදුවන අබාධ හා අධික රුධිරය පිටවීම<br>ප්‍රසූතියේදී මව මිය යාමේ අවධානමට ලක් වීම<br>වඳභාවය<br>ලිංගිකව බෝවන රෝග ඇති වීම | පශ්චාත් කම්පන මානසික ආබාධය<br>මෙම කම්පන තත්ත්වයන් ආතතිය, විෂාදය, කාංසාව වැනි තත්ත්ව දක්වා වර්ධනය වීම<br>ලිංගිකව හැසිරීමට ඇති බිය හා අකමැත්ත<br>ලිංගික තෘප්තිය අහිමි වීම<br>තම ශරීර අවයවවලට වෛර කිරීමට පෙළඹීම |

(https://saruwapittala.blogspot.com).

ඉහත බලපෑම් ඉස්මතු කර බැලීමේදී පෙනී යන්නේ කුමන අරමුණකින් මෙම ක්‍රියාවලිය සිදු කරනවාද යන්නයි. ලොව පුරා සිදුවන මෙම ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය හේතුවෙන් මාතෘ මරණ සැලකිය යුතු ප්‍රමාණයක් සිදු වේ. මන්ද ඉතා කුඩා සිදුරක් සිටින සේ මසා දමන යෝනිය දරුවෙකු ප්‍රසූත කිරීමේදී විශාල වශයෙන් කැපිය යුතු වේ. මෙය සරල කටයුත්තක් නොවන අතර, එමගින් වැඩි රුධිර ප්‍රමාණයක් පිටවේ. එපමණක් නොව පෙර කරන ලද මැසීම් ගලවා දැමීම අතිශය වේදනාකාරී අත්දැකීමක් වේ.

මෙහි බරපතල ම හානියක් වන්නේ කාන්තාවට ලිංගික තෘප්තිය ලැබීමට නොහැකි වීමයි. කාන්තාව තම ලිංගික සතුට පුරුෂයා වෙනුවෙන් කැප කර ඇත. මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවලියකි. එමෙන්

ම මේ හේතු නිසාම තම ලිංගික ජීවිතය අසාර්ථක වනු ඇත. ඒ නිසාම පවුල් ජීවිතය ද අසාර්ථක වනු ඇත. මන් ද යත් ලිංගික ජීවිතය පවුල් දිවියට සෘජු ලෙස ම බලපාන බැවිනි. ලිංගිකව හැසිරීමේදී වන වේදනාව දරා ගැනීමට නොහැකි වීම හා ඒ නිසාම ලිංගිකව හැසිරීමට ඇති බිය හා පිළිකුල් සහගත බව මීට හේතුව වේ.

එමෙන් ම ලිංගිකව සිදුවන රෝග බෝවීම මේ අතර ප්‍රධාන තැනක් ගනී. විශේෂයෙන් ම ස්ත්‍රී ලිංගික අවයව ඡේදනය කිරීමේ දී යොදගනු ලබන උපකරණ මෙයට ප්‍රධාන ම හේතුව වේ. කාලයක් තිස්සේ එකම ක්‍රියාවලියට යොදගනු ලබන මෙම උපකරණ එකවර බොහෝ පිරිසකගේ අවයව ඡේදනයට ලක් කරන්නේ ජීවානුහරණය කිරීම හෝ බොහෝ විට කිසිඳු පිරිසිඳු කිරීමකින් තොරවය. මේ නිසාම එක් අයෙකුට යම් ලිංගාශ්‍රිත බොවන රෝගයක් තිබුණහොත් එය අනික් තැනැත්තාට බෝවීම නිරන්තරයෙන් සිදු වේ.

මෙතරම් අවදනම් සහගත ප්‍රතිඵල උද කරන ස්ත්‍රී ලිංගික අවයව ඡේදනය කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමේ අරමුණ කෙතරම් අසාධාරණ හා අමානුෂීය ද යන්න ඉහත තොරතුරු අනුව පැහැදිලි වේ.

**ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ ලෝක ව්‍යාප්තිය**

වගුව 2: ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ ලෝක ව්‍යාප්තිය

| | |
|---|---|
| Australia | Pitta-Patta නම් ඕස්ට්‍රේලියානු මුල් පදිංචිකරුවන් අතර දක්නට ලැබේ. මීට අමතරව පදිංචියට පැමිණි සංක්‍රමණිකයින් අතර ද දක්නට ලැබේ. 1991 දී Australian Bureau of Statistics Censue විසින් කකරන ලද විමර්ශනයකට අනුව චර්ම ඡේදනයට ලක් වූ 76000 ක පිරිසක් ජීවත්වන බවට ගණනය කර ඇති අතර, එය 1996 වන විට 87000 ඉක්මවා ඇත. |
| Austria | The African Women's Organization of Astria මගින් කරන ලද පර්යේෂණයකට අනුව ඔස්ට්‍රියාවේ සිටින අප්‍රිකානු සංක්‍රමණිකයින් අතර 30% කට වැඩි ප්‍රමාණයයක පවුල්වල ගැහැණු දරුවන් චර්මඡේදනයට ලක් කොට ඇත. |
| Belgium | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී චර්මඡේදනයට ලක්වී තිබේ. නමුත් බෙල්ජියමේ ස්ත්‍රී චර්මඡේදනය හා ඒ අශ්‍රිත ක්‍රියාවන් දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස නීති පද්ධතියට ඇතුළත් කර තිබේ. |
| Benin | 1993 දී National Committee of Harmful Traditions Practice මගින් කරන ලද අධ්‍යයනයකට අනුව 50%ක ව්‍යාප්තියක් දක්නට ලැබේ. උතුරු පළාත්වල වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර, Boko, Nago, Peul, Wama යන ජනවාර්ගික කණ්ඩායම් මේ සඳහා ප්‍රධාන වේ. වයස අවුරුදු 5-10 අතරේ ගැහැණු ළමුන්ට සිදුකෙරේ. නමුත් මෙම රටේ ද ස්ත්‍රී චර්මඡේදනය හා ඒ අශ්‍රිත ක්‍රියාවන් දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස නීති පද්ධතියට ඇතුළත් කර තිබේ. |
| Burkina Faso | 1996 දී සිදු කරන ලද විමර්ශනයකට අනුව 66.35% ක ව්‍යාප්තියක් ඇස්තමේන්තු කර ඇති අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1998 දී 72% බවට පත් වී තිබේ. වැඩි වශයෙන් ක්‍රියාත්මක වන්නේ ඡේදනය කිරීමේ දෙවන ක්‍රමය වේ. වයස අවුරුදු 1-7 සීමාවේ දී වැඩිදුරටත් ක්‍රියාත්මක වේ. නමුත් මෙම ක්‍රියාවන් සිදු කිරීම මෙරට දණ්ඩ නීති සංග්‍රහයේ දඩුවම් ලැබිය හැකි වරදක් බව දක්වා ඇත. |
| Cameroon | නිරිත හා උතුරු පළාත්වල ඡේදනය කිරීමේ දෙවන ක්‍රමය ක්‍රියාත්මක වේ. මුස්ලිම් ගැහැණු ළමයි 100% ද ක්‍රිස්තියානි ගැහැණු ළමයි 63.6% ද බලපෑමට ලක් වී ඇත. |
| Canada | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයට ලක්වී තිබේ. ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය හා ඒ ආශ්‍රිත ක්‍රියාවන් සිදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස අපරාධ සංග්‍රහයට ඇතුලත් කර තිබේ. |
| Chad | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රම රටේ සෑම පළාතකම ක්‍රියාත්මක වේ. තෙවන ක්‍රමය නැගෙනහිර පලාතේ බහුල වශයෙන් ක්‍රියාත්මක වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම් වලට අනුව 1991 දී 91%ක ව්‍යාප්තියක් තිබී ඇත. ස්ත්‍රී චර්ම ඡේදනය වැළැක්වීමට 1995 දී නීති පනවා තිබේ. |

| | |
|---|---|
| Cote d'Ivoire | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රම රටේ සෑම පළාතකම ක්‍රියාත්මක වේ. 1994 ස්ත්‍රී චර්ම ඡේදනය ව්‍යාප්තිය සම්බන්ධයෙන් කරන ලද ජාතික ජන විකාශන හා සෞඛ්‍ය සමීක්ෂණයට අනුව 43%ක ව්‍යාප්තියක් තිබී ඇත. මුස්ලිම් ගැහැණු ළමයි 80%ක් ද ක්‍රිස්තියානි ගැහැණු ළමයි 16% ද බලපෑමට ලක් වී ඇත. බොහෝවිට වයස අවුරුදු 10ට පෙර මුහුණදීමට සිදු වේ. 1998 දී ස්ත්‍රී චර්ම ඡේදනය වැළැක්වීමට නීති පනවා තිබේ. |
| Denmark | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. සෝමාලියානු කාන්තාවන් ප්‍රධාන වේ. |
| Djbouti | ඡේදනය කිරීමේ දෙවන හා තෙවන ක්‍රම ක්‍රියාත්මක වේ. 98%ක ව්‍යාප්තියක් දක්නට ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව ප්‍රධාන ක්‍රමය ලෙස දක්වන්නේ තෙවන ක්‍රමයයි. නමුත් මෙම ක්‍රියාවන් සිදු කිරීම මෙරට දණ්ඩ නීති සංග්‍රහයේ දඩුවම් ලැබිය හැකි වරදක් බව දක්වා ඇත. |
| Egypt | ඊජිප්තුව පුරාම මුස්ලිම් හා ක්‍රිස්තියානි පිරිස් අතර දක්නට ලැබේ. ඡේදනය කිරීමේ සියළු ක්‍රම ක්‍රියාත්මක වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1995 දී 97%ක ව්‍යාප්තියක් තිබී ඇත. නමුත් 2007 දී ඊජිප්තුවේ සෞඛ්‍ය හා ජනගහණ අමාත්‍යාංශය විසින් ස්ත්‍රීන්ගේ ජනනේන්ද්‍රිය කොටස් ඡේදනය කිරීම තහනම් කර තිබේ. |
| Ethiopia | ඉතියෝපියාව පුරාම ස්ත්‍රීන්ගේ ජනනේන්ද්‍රිය කොටස් ඡේදනය කිරීම දක්නට ලැබේ. එය ප්‍රතිශතයක් වශයෙන් 73.6% ක ව්‍යාප්තියකි. ඉතියෝපියාවේ ජන වාර්ගික කණ්ඩායම් 46කම ස්ත්‍රීන්ගේ ජනනේන්ද්‍රිය ඡේදනය කිරීම් දක්නට ලැබෙන අතර ඇතැම් කණ්ඩායම් අතර 75%ක ව්‍යාප්තියක් දක්නට ඇත. |
| France | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැනු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයට ලක්වී තිබේ. 1992 දී Women's Group for the Abolition of Sexual Mutilation මගින් දක්වනු ලබන්නේ 27 000 ක කාන්තාවන් හා ගැහැනු ළමුන් මෙයින් පීඩාවට පත්ව ඇති බවයි. මෙම ක්‍රියාවන් සිදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් බව දණ්ඩනීති සංග්‍රහය තුළ දක්වයි. |
| Gambia | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රම වැඩි වශයෙන් හා තෙවන ක්‍රමය සුලු වශයෙන් ද ක්‍රියාත්මක වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1985 දී 80%ක ව්‍යාප්තියක් තිබී ඇත. විවිධ ජනවර්ග අතර විවිධ ප්‍රතිශත දක්නට ලැබේ. |
| Germany | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. මෙම ක්‍රියාවලිය හා ඒ ආශ්‍රිත කටයුතු සිදුකිරීම දඩුවම් ලැබිය හැකි වරදක් බව මෙරට දණ්ඩනීති සංග්‍රහය තුළ දක්වයි. |
| Ghana | ඡේදනය කිරීමේ දෙවන ක්‍රමය නැගෙනහිර හා බටහිර පළාත්වල දක්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1986-1987 දී 30%ක ව්‍යාප්තියක් තිබී ඇත. රට තුළ ක්‍රියාත්මක අපරාධ සංග්‍රහයේ දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස දක්වා ඇත. |
| Guinea | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. 1998 දී 98% ක කාන්තාවන් පීඩනයට පත්ව ඇත. දණ්ඩනීති සංග්‍රහය තුළ තහනම් කර තිබේ. රජය මෙම ක්‍රියාදමය ඉවත් කිරීමට අවුරුදු 20ක (1996-2015) වැඩසටහනක් ආරම්භ කර ඇත. |
| Guinea Bissau | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 50%ක ව්‍යාප්තියක් ඇත. ඉන් 100%ක් මුස්ලිම් කාන්තාවන් වේ. Fulla & Mandigne කාන්තාවන් 70%-80% ද නාගරික ස්ත්‍රීන් 20%-30% ද ඡේදනය කිරීමට ලක්ව තිබේ. |
| Italy | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. ඉන් සෝමාලියා හා ඉතියොපියා කාන්තාවන් ප්‍රධාන වේ. |
| Kenya | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. 1998 දී වයස 15-19 අතර 38%ක ව්‍යාප්තියක් පැවත ඇත. විවාහය සඳහා සුදුසුකමක් ලෙස සලකයි. චර්ම ඡේදනය නීතිය මගින් තහනම් කර ඇත. |
| Liberia | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1984 දී 50%-70% ක ව්‍යාප්තියක් පැවත ඇත. |

| | |
|---|---|
| Mali | National Demographic and Health Survey දක්වන පරිදි 1995/96 දී 94% ක ව්‍යාප්තියක් රට පුරාම පැවතී ඇත. ඡේදනය කිරීමේ පළමු ක්‍රමයෙන් 52%ක් ද දෙවන ක්‍රමයෙන් 47%ක් ද, තෙවන ක්‍රමයෙන් 1%ක් ද දක්නට ලැබේ. මුස්ලිම් ගැහැණු ළමයින් 94%ක් ද, ක්‍රිස්තියාන් ගැහැණු ළමයි 85%ක් ද පීඩාවට ලක් වී ඇත. |
| Mauritania | සෞඛ්‍ය අමාත්‍යාංශය දක්වන්නේ ඡේදනය කිරීමේ පළමු ක්‍රමයෙන් 25%ක් ද දෙවන ක්‍රමයෙන් 20%ක් ද පවතින බවයි. Soninke ජන වර්ගයේ 92% Halpulaar ජන වර්ගයේ 95.5 ක ව්‍යාප්තියක් ද පවතී. |
| Newzeeland | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. 2002 වසරේ දී ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය වැළැක්වීමට නීති පනවා තිබේ. |
| Niger | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1998 දී 5%ක ව්‍යාප්තියක් පැවතී ඇත. Peul ජනවර්ගයේ 30%ක් ද Zarms ජනවර්ගයේ 9%ක් ද, දක්නට ඇත. 2003 දී දණ්ඩ නීති සංග්‍රහයට ගෙනා නව වගන්තියක් මගින් ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය හා ඒ ආශ්‍රිත ක්‍රියාවන් සිදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස දක්වා ඇත. |
| Nigeria | ඡේදනය කිරීමේ සියලු ක්‍රම දක්නට ලැබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වන්නේ ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනයට සෑම දවසක ම කාන්තාවන් හා ගැහැණු ළමයින් 6000ක් පමණ ලක්වන බවයි. 50%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දක්නට ලැබේ. |
| Senagal | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රමය දක්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1990 දී 20%ක ව්‍යාප්තියක් පැවත ඇත. 1999 දී දණ්ඩ නීති සංග්‍රහයට ගෙනා නව වගන්තියක් මගින් ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය හා ඒ ආශ්‍රිත ක්‍රියාවන් සිදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස දක්වා ඇත. |
| Sierra Leone | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රම සියළුම මුස්ලිම් හා ක්‍රිස්තියානි ජනවර්ග අතර දැකිය හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1997 දී 90%ක ව්‍යාප්තියක් දක්නට ලැබී ඇත. |
| Somalia | ඡේදනය කිරීමේ සියලු ක්‍රම බහුලව දක්නට ලැබේ. ව්‍යාප්තිය 98%කි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1982-1993 අතර කාලයේ දී 96%-100% ව්‍යාප්තියක් පැවතී ඇත. තෙවන ක්‍රමය 80%ක් භාවිත කරයි. |
| Sudan | 1990 දී Demographic and Health Survey දක්වන පරිදි 89% කටත් වඩා විවාහක කාන්තාවන් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක්ව ඇත. උතුර, නැගෙනහිර හා බටහිර පළාත්වල කාන්තාවන් මෙම ක්‍රියාවලියට ලක්වී තිබුණ ද දකුණු පළාතේ ක්‍රියාත්මක වීමක් දක්නට නොලැබේ. මෙම ක්‍රියාවලිය මෙරට නීතිය මගින් තහනම් කොට ඇත. |
| Tanzania | ඡේදනය කිරීමේ දෙවන හා තෙවන ක්‍රම පවතින අතර, 17.6% ව්‍යාප්තියක් පවතී. 1998 Sexual Offences Provision Act මගින් ස්ත්‍රී චර්ම ඡේදනය තහනම් කරනු ලැබීය. |
| Togo | ඡේදනය කිරීමේ පළමු හා දෙවන ක්‍රම පවතී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගණනය කිරීම්වලට අනුව 1996 දී 12%ක ව්‍යාප්තියක් පැවත ඇත. 1998 දී නීතිය මගින් තහනම්කොට ඇත. |
| United Kingdom | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. ඉතියෝපියානු, ඊජිප්තියානු, නයිජීරියානු, සෝමාලියානු, සුඩාන් ස්ත්‍රීන් ප්‍රධාන වේ. 2003 Female Genital Multilation Act මගින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය තහනම්කොට තිබේ. |
| United State Of America | ඇතැම් සංක්‍රමණික කාන්තාවන් හා ගැහැණු ළමයින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට ලක් වී තිබේ. ඉතියෝපියානු, ඊජිප්තියානු, නයිජීරියානු, සෝමාලියානු, සුඩාන්, ඝානා, කෙන්යා, ලයිබීරියා, උගන්ඩා, ටැන්සානියා, සියරා ලියෝන් හි ස්ත්‍රීන් ප්‍රධාන වේ. Fedaral Prohibition of Female Genital Multilation Act මගින් ස්ත්‍රී චර්ම ඡේදනය තහනම් කර තිබේ. |

(https://who.int).


යුනිසෙෆ් සංවිධානය දක්වන ආකාරයට අප්‍රිකානු, ආසියානු හා මැදපෙරදිග කෝටි 20ක් දූරියන් හා කාන්තාවන් යෝනි සුන්නත් කිරීමට ගොදුරු වී ඇති බව දක්වේ.

මීට අමතරව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය නොහොත් ස්ත්‍රී ලිංගික අවයව ඡේදනය සිදු නොවන බව සිතා සිටියත්, පසුගිය දිනෙක ළමා රෝහලෙන් වාර්තා වූ සිද්ධිය හේතුවෙන් මෙම ක්‍රියාවලිය ලංකාවේද සිදුවන බව ප්‍රසිද්ධ රහසක් විය. එහිදී දෙමාපියන් තම අවුරුද්දක් වයසැති සිඟිති දියණියගේ ලිංගික අවයව ඡේදනය කිරීම සඳහා මුස්ලිම් වෛද්‍යාවරයෙකු බව රැවටී ළමා රෝහලේ වෛද්‍යවරයෙකු වෙත රැගෙන විත් ඇත. එහිදී වෛද්‍යවරයා එය ප්‍රතික්ෂේප කර දෙමාපියන්ට බැන වැදීමේ දී ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ දෙමාපියන් වශයෙන් දූරිය සුන්නත් කිරීමේ අයිතිය තමන් සතුව පවතින බවයි (https://mahakalusinhalaya.wordpress.com).

ලංකාවේ නීතිය මගින් සියලු දරුවන්ගේ අයිතිය රාජ්‍යය සතුය යන ප්‍රකාශය මෙම දෙමාපියන් නොදන්නවා විය හැකිය. නමුත් මෙම සිදුවීමෙන් මෙතෙක් කල් සැඟව තිබූ කුඩා දූරියන්ගේ ලිංගික අවයව වලට හානි පැමිණවීම ලංකාවේද සිදුවන බව තහවුරු විය.

**ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ පැතිරීම (Prevalence of FGM)**

සිතියම 1: ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ පැතිරීම




Prevalence of (FGM) among women age 15-49 In Africa and the Middle East 2015 (https://bjfm.co.uk).

ඉහත පර්යේෂණය මගින් පැහැදිලි වන්නේ යෝනි සුන්නත අප්‍රිකානු හා මැදපෙරදිග රටවල්වල බොහෝ සෙයින් ව්‍යාප්ත වී ඇති බවයි. එමෙන්ම ප්‍රධාන ම කරුණ නම් ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය පෙරට සාපේක්ෂව බලන විට එහි වැඩි වීමක් දක්නට ලැබීම කණගාටුවට හේතුවක් වන බවයි.

**ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග**

අද වන විට කාන්තා සුන්නත්කරණය අන්තර්ජාතික වශයෙන් හඳුනාගන්නේ කාන්තාවන්ට එරෙහිව සිදු කරන වෙනස්කොට සැලකීමක් ලෙසය. කාන්තා සුන්නත්කරණය මගින්,

- සෞඛ්‍යයට පවත්නා කාන්තා අයිතිය තර්ජනයට ලක් වන බවත්
- කාන්තාවගේ ආරක්ෂාව අනතුරට ලක්වන බවත් පුද්ගලයෙකු ලෙස කාන්තාවකට පවතින ගෞරවය කෙලෙසෙන බවත්
- කෲර, අමානුෂික වදහිංසා වලින් සහ පහත්කොට සැලකීම් වලින් මිදීමට පවත්නා කාන්තා අයිතිය මෙමගින් උල්ලංඝනය වන බවත්

අද වන විට අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලැබේ (https://adhahasa.wordpress.com).

මේ නිසාම ස්ත්‍රී ජනනේද්‍රිය ඡේදනය පිළිබඳ අවධානය යොමු වූ මුල් කාලයේ සිට ම විවිධ පුද්ගලයින් හා සංවිධානවල දැඩි උත්සහය හා ඉල්ලීම පරිදි මේ සම්බන්ධව නීති රෙගුලාසි උත්පාදනය වන්නට විය. එපමණක් නොව මෙම ක්‍රියාවලිය ලෝකයෙන් තුරන් කිරීම සඳහා නොනැවතී ක්‍රියා කරන සංවිධාන හා ඒවා පණ ගන්වන සම්මුතීන් බිහි වීම ද මේ මොහොතේ පවා සිදුවෙමින් පවතී.

ස්ත්‍රීන්ගේ ජනනේන්ද්‍රිය කොටස් ඡේදනය කිරීමට එරෙහිව පවතින ආයතන හා සම්මුතීන් පහත දැක්වේ.

ජාත්‍යන්තර සම්මුතීන්

- 1994 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
- 1996 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
- 1996 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
- 1979 කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය
- 1984 කෲර, අමානුෂික, අවමන්සහගත සැලකිලි හා දඬුවම්වලට එරෙහි සම්මුතිය
- 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
- 1993 මානව හිමිකම් පිළිබඳ විශ්ව සම්මේලනයේ වියානා ප්‍රකාශනය
- 1993 කාන්තාවන්ට එරෙහි හිංසනය පිටු දැකීමේ ප්‍රකාශනය

ප්‍රාදේශීය සම්මුතීන්

- 1950 මානව හිමිකම් හා මූලික නිදහස සුරැකීමේ යුරෝපියානු සම්මුතිය
- 1979 මානව හිමිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතිය
- 1981 මානව අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය
- 1990 ළමා අයිතිවාසිකම් හා සුභසාධනය පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය
- 2003 අප්‍රිකානු කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රොටකෝලය

ආයතන

- බීජිං ප්‍රකාශනය - 1995 සැප්තැම්බර් 15 දින කාන්තාවන් පිළිබඳ සිව්වන ලෝක සමුළුවේ ක්‍රියාකාරීත්වය සඳහා වූ වේදිකාව
  (Beijing Declaration and Platform for Action of the Fourth World Conference on Women, Beijing, Chaina, 4-15 September 1995)
- 2001 නොවැම්බර් දෙවන දින සම්මත කරගත් සංස්කෘතික ප්‍රකාශනවල විවිධත්වය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය.
  (UNESCO Universal Declaration on Cultural Diversity, adopted 2 November 2001)
- 2005 ඔක්තොම්බර් මාසයේ දී සම්මත කරගත් සංස්කෘතික ප්‍රකාශනවල විවිධත්වය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය.
  (®onvention on the Protection of the Diversity of Cultural Expressions, adopted October 2005)
- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය කාන්තා තත්ත්වය පිළිබඳ කොමිෂන් සභාවේ දී සම්මතකරගත් ස්ත්‍රී ලිංග ඡේදනය අවසන් කිරීම පිළිබඳ යෝජනාව
  (United Nations Economic and Social Council (ECOSOC), Commission on the Status of Women. Resolution on the Ending of Female Genital Mutilation - March 2007)
- කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ කමිටුව
- මානව හිමිකම් කමිටුව

- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව
- ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව
- ක්‍රියාකාරීත්වය සඳහා වූ කයිරෝ සම්මේලනය

(https://endvawnow.org).

මෙකී අයුරින් කාන්තා චර්මඡේදනය සිදු කිරීම තහනම් කිරීම උදෙසා රටවල විවිධ ආයතන හා විවිධ සංවිධාන විසින් නොයෙකුත් පියවර රාශියක් ගෙන තිබේ. මේ සම්බන්ධව මෑතකාලීනව ක්‍රියාත්මක කර ඇති අලුත් ම ක්‍රියාවලිය වන්නේ කාන්තා සිරුරේ අයිතිය අහිමි කරන යෝනි සුන්නත එංගලන්ත පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමයි.

2003 වසරේ සිට එංගලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තයේත්, 2005 වසරේ සිට ස්කොට්ලන්තයේත්, මෙම ක්‍රියාව නීතියෙන් තහනම් කරනු ලැබ ඇති නමුත්, එක්සත් රාජධානියේ වෙසෙන ඇතැම් ප්‍රජා කණ්ඩායම් දිගටම එම චාරිත්‍රයේ යෙදෙන බව බලධාරීන්ට හසු වී ඇත. ප්‍රජාව අතර දක්නට ලැබෙන විවිධ ජන සංයුතීන් නොතකා හරිමින් තම සිරුරේ අයිතිය තමන් සතු බව හා ඊට හානි කිරීමේ අයිතියක් වෙනත් කිසිවෙකුට නැති බව රට පුරාම ළමුන්ට පොදුවේ ඉගැන්වීම් ඉතා ප්‍රයෝජනවත් බව Female genital mutilation (FGM) මධ්‍යස්ථානය පෙන්වා දෙයි.

බර්නාඩෝ ළමා සුභසාධක ආයතනය හා පළාත් පාලන සම්මේලනය හවුලේ ක්‍රියාත්මක කරන ජාතික Female genital mutilation (FGM) මධ්‍යස්ථානයේ ඉලක්කය 2030 වන විට යෝනි සුන්නත සහමුලින්ම සමාජයෙන් තුරන් කර දැමීමය. ඒ අනුව 2020 වසරේ නව සබඳතා සහ ලිංගික අධ්‍යාපන විෂය දහරාව ක්‍රියාවට නංවන විට ළමුන්ට යෝනි සුන්නත හෙවත් ස්ත්‍රී චර්ම ඡේදනය (FGM) පිළිබඳව ඉගැන්වීම ආරම්භ කරන මෙන් ජාතික FGM මධ්‍යස්ථානය ප්‍රාථමික පාසල් වලින් ඉල්ලීමක් කර ඇත.

"ප්‍රාථමික පාසල්වල මේ මාතෘකාව පිළිබඳව ළමුන්ට ඉගැන්වීමේ දී ඇතැම් ව්‍යතිරේඛ ඉදිරිපත් විය හැකි නමුත් වයසට ඔබින මට්ටමින් ළමුන් කේන්ද්‍ර කරගනිමින් එම කාර්යය සිදුකළ හැකි බව අපට පෙනීගොස් තිබෙනවා. යෝනි සුන්නත් කරනු ලැබීම ගැන ප්‍රාථමික පාසල්වල ළමුන්ට ඉගැන්වීම මගින් එම කාරණය ගැන කතා කරන්නට අපි ඊළඟ පරම්පරාවට ශක්තියක් ලබාදෙනවා. ඒත් මේක ඊළඟ පරපුර අවදි කිරීමක් පමණක් නොවේ. තමන් අයත් ප්‍රජා කණ්ඩායම තම ලිංගිකත්වය හා වෘත්තිය නොතකා යමින් කවුරුත් මේ සංවාදයට එකතු වීම අවශ්‍යයි. එහෙම වුණොත් යෝනි සුන්නත සැඟවුණු අපරාධයක් ලෙස කරගෙන යාමට බැරි තත්ත්වයක් උදාවේවි" - (ලීනන් බර්තොලමිව් - ජාතික FGM මධ්‍යස්ථානයේ ප්‍රධානී)

මේ අනුව යෝනි සුන්නත පාසල් විෂය මාලාවට හඳුන්වා දිය යුතු ආකාරය, දෙමාපියන් ඊට සම්බන්ධ කරගන්නේ කෙසේ ද යන්න සහ සිසුන් සමඟ සාකච්ඡා කිරීමේ දී ඔවුන්ගේ උදව් ලබා ගැනීමට අදාළ උපදෙස් ජාතික FGM මධ්‍යස්ථානය ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා නිර්මාණය කර දී ඇත.


යෝනි සුන්නත යනු, ඊට ගොදුරු කරගනු ලබන, දැරියන් මෙන් ම ඔවුන්ගේ පවුල් අසීමිත ලෙස පීඩාවකට පත් කෙරෙන පිළිකුල් සහගත අපරාධයක් ය යන්න ළමුන්ට අවබෝධ කරදීම ඉතාම වැදගත් කරුණක් බව එංගලන්ත අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර සිටී. මේ නිසාම යෝනි සුන්නත ශාරීරික වශයෙන් මෙන් ම සංවේදීභාවය අතිනුත් කාන්තාවන්ට හානි කරන සාපරාධී වරදක් වන බව නව සබඳතා සහ ලිංගික අධ්‍යාපනය විෂය ධාරාවේ කොටසක් ලෙස 2020 සැප්තැම්බර් මාසයේ සිට ඉගැන්වීමට එංගලන්ත පාසල් පද්ධතිය තීරණය කර ඇත.

මීට අමතරව අප්‍රිකාවේ යෝනි සුන්නත නතර කිරීමට දිරි දීමක් වශයෙන් ඩොලර් දසලක්ෂ හැට දහසක මූල්‍යාධාර සැපයීමට බ්‍රිතාන්‍ය රජය එකඟ වී ඇත. එය 2030 වන විට යෝනි සුන්නත හෙවත් චර්ම ඡේදනය ලෝකයෙන් උපුටා දැමීම සඳහා එක් රටක් විසින් සපයනු ලබන විශාලත ම ආයෝජනය බව බ්‍රිතාන්‍ය රජය පවසයි (https://blog.hirutv.lk). ලෝකයේ දියුණුවත් සමඟම පුද්ගලයන් ආකල්ප වලින් දියුණු වීමක් ද සිදුවිය යුතුය. නමුත් මෙම පදනම් විරහිත ක්‍රියාව පසුගිය වසරවල් වලට වඩා වැඩි වී ඇත. මෙයට සාපේක්ෂව කෝණ දෙකකින් හේතු පැහැදිලි කළ හැකිය. එකක් වන්නේ සැබවින්ම මෙම ක්‍රියාවලිය පෙරට සාපේක්ෂව පුද්ගලයින් විසින් සිදු කිරීමය. අනෙක් කාරණාව වන්නේ ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය පිළිබඳ ලෝක අවධානය යොමු වීමත් සමඟම සැඟව තිබූ මෙම ක්‍රියාවලිය විවෘත්ත වීම වේ. ඒ අනුව ගෝත්‍ර අතර වැඩි වශයෙන් සිදුවන මෙම ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂණ දියත් කිරීමත් සමඟ සොයාගන්නා ලද දත්තයන් ප්‍රමාණය වැඩි වීමය. කෙසේ නමුත් පසුගිය වසරවල් හා

සංසන්ධනය කිරීමේදී 2019 වන විටත් එහි වැඩි වීමක් පැවත ඇත.

උදාහරණ:

රූපය 9: ජර්මනියේ ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයේ අගයන්




(https://amp.dw.com)

ඉහත දැක්වෙන්නේ ජර්මනියේ වයස අවුරුදු 18ට අඩු ගැහැණු ළමුන්ගේ ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය 2017, 2018, 2019 යන වසර තුන ඇතුළත ගන්නා අගයන් වේ. මෙහිදී පෙනී යන්නේ 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේත්, 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේත්, සැලකිය යුතු වැඩි වීමක් පෙන්වන බවයි. ඉහත නිදසුන දෙස බලන විට මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගයන් කොයිබට ද යන ප්‍රශ්නය මතු වේ.

**නිගමන සහ යෝජනා**

සැබවින් ම මිනිසෙකු වී ඉපදීම අත්ශයින් ම දුර්ලභ වනවා මෙන් ම එය කෙනෙකු ලබන ජයග්‍රහණයක් ලෙස දක්විය හැකිය. මිනිසෙකු ලෙස ඉපදීම නිසා ම මිනිසුන්ට මානව අයිතිවාසිකම් හිමි වේ. මේවා හිමිකම් ලෙස නම් කළත් නැතත් මිනිසාට මේ අයිතීන් පවතී. මිනිසාගේ මෙම අයිතීන්වලට නමක් යොදගනිමින් ඒවා ලේඛනගත කර ඇත්තේ මෙම අයිතීන්වලට බලපෑම් සිදුවන බැවිණි. එසේ සමස්ත වූ මානව අයිතීන්ගෙන් රටින් රට වෙන වෙනම පිළිගත් අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් වේ. ඒවා අදාළ රටෙහි ව්‍යවස්ථාවේ ලිඛිතව සඳහන් වේ. මේ අතර කාන්තාව වෙනුවෙන් පවතින අයිතිවාසිකම් කාන්තා අයිතිවාසිකම් වේ. මේ සියලුම අයිතීන් තිබුණද යෝනි සුන්නත හෙවත් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය ස්ත්‍රියගේ මානව අයිතිවාසිකම් පවා උල්ලංඝනය කරන ක්‍රියාවලියකි.

මන්ද යත් තම ශරීරයේ තිබෙන අංගයන් උපතින්ම පුද්ගලයෙකුට ලැබෙන දේවල් වන අතර, ඒවා සොබාදහම විසින් හිමිකරදෙන්නේ කිසියම් කාර්යයක් ඉටු කිරීමටය.ශරීරයේ පවතින සෑම අංගයකින් ම කුමක් හෝ කාර්යක් ඉටු වේ. එසේ අවශ්‍ය නොවන ඉන්ද්‍රියන් වේ නම් ඒවා පරිණාමයත් සමඟ ක්ෂය වී යනු ඇත. වානර මිනිසාට තිබූ වලිගය නූතන මිනිසාට නොතිබෙන්නේ ඒ නිසාය. මිනිසාගේ උණ්ඩකපුච්චය නම් ඉන්ද්‍රිය ක්ෂය වෙමින් පවතින්නේ අතීතයේ මෙන් ගල් වැලි සහිතව නොව, නූතන මිනිසා පිරිසිදු කරගත් පිසූ ආහාර අනුභව කරන හෙයින් ගල් වැලි තැන්පත් වීමක් හෝ පෙරීමක් අවශ්‍ය නොවන බැවිනි. නමුත් කාන්තා ලිංගික අවයව සියල්ල පිහිටා තිබෙන්නේ සෑම කොටසකින් ම යම් කාර්යයක් ඉටු කිරීමටය. නිදසුන් ලෙස යෝනි මාර්ගය අවශ්‍ය ප්‍රමාණයට නිර්මාණය වී ඇත්තේ වේදනාවකින් තොරව ඔසප් පිට කිරීමට, ලිංගිකව එක්වීමට හා දරුවන් ප්‍රසූත කිරීමටය. භගමණිය නම් අවයවය පිහිටා ඇත්තේ කාන්තාවට ලිංගික තෘප්තිය ලැබීමටය. එමෙන් ම මෙය ශරීරයේ ඇති අධිසංවේදී ඉන්ද්‍රියකි. මුත්‍රාශය පිහිටා ඇත්තේ ශරීරයේ තුලනයට අවශ්‍ය යූරියා පිටකිරීමටය. යෝනි තොල් පිහිටා ඇත්තේ යෝනි මාර්ගයේ ආරක්ෂාවයට. ඒ අනුව මේ සියලුම අවයව ශරීරයට කෙතරම් අවශ්‍ය දැයි පැහැදිලිය. මෙයින් එක් කොටසක් හෝ අඩු වුවහොත් ශරීරයේ කෘත්‍යයන් අඩපණ වේ.

ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනයෙන් සිදු කරන්නේ ද මෙයයි. සියල්ලන් ම මනුෂ්‍යයින් නම් පිරිසකට තම ජීවිතයේ තෘප්තිය හා අනාගතය අහිමි කිරීම අසාධාරණ ක්‍රියාවලියකි. එය පදනමකින් තොර වීම තවත් හේතුවක් වේ. ලෝකයේ මිනිසුන් දෙයක් සිදුකරන්නේ යම් සාධාරණ හේතු ඇතිවය. නමුත් මෙම ක්‍රියාවලිය සඳහා ගොඩනගන හේතු කිසිඳු තාර්කික බවකින් තොර හා යල්පැනගිය පදනම් විරහිත හේතු වේ. මෙම පදනම් විරහිත කරුණු වෙනුවෙන් ලොව පුරා බිලියන ගණනක් ගැහැනු දරුවන්ට හා කාන්තාවන්ට සිදුකරණ මෙම ක්‍රියාවලිය සැබවින් ම අපරාධයකි.

නොයෙකුත් සංවිධාන හා කාන්තාවාදී ව්‍යාපාර ලොව පුරා සිදුවන මෙම හිංසනය තුරන් කිරීම සඳහා බොහෝ වෙහෙස ව කටයුතු කරයි. නොයෙකුත් නීතීන් හා කොන්දේසි හඳුන්වා දෙමින් ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය මුලිනුපුටා දැමීමට මීට දශකයකට පෙර සිට ගන්නා උත්සාහය යම් ප්‍රමාණයකින් සාර්ථක වුවද, සිදු කරනු ලබන පර්යේෂණවලට අදළ දත්ත අනුව බලන විට මෙය 2030 වන විට අවසන් කළ හැකි දැයි යන්න ගැටලු සහගතය. නමුත් ලොවපුරා සිදුවන මෙම කාන්තා හිංසනයට තිත තැබිය යුතුමය. ස්ත්‍රී ජනනේන්ද්‍රිය

ඡේදනය බහුල ලෙස සිදුවන රටවල කාන්තාවන් මෙම ක්‍රියාවලියට එරෙහිව නැගී සිටීම ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය තුරන් කිරීමේ ව්‍යාපාරයට මහත් පිටුබලයක් වනු ඇත. මත් ද යත් සම්ප්‍රදායට තම වේදනාව යට කර සිටින කාන්තාවන් තම ශරීර අයිතිය වෙනුවෙන් පෙනී සිටීමට පොළඹවා ගැනීමට ඒ ඔස්සේ හැකියාව ලැබෙනු ඇත.

2030 දී ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය ලෝකයෙන් තුරන් කිරීමට අරමුණු කිරීම හා එංගලන්ත පාසල් දරුවන්ට මේ සම්බන්ධව ඉගැන්වීම යහපත් ප්‍රවණතාවකි. පුද්ගල ජීවිතයක වටිනාකම දරුවන්ට ඉගැන්විය යුතුය. මෙම ක්‍රියාවලියට ලක්වන කාන්තාවක් නැත්නම් ගැහැනු දරුවෙක් විඳින පීඩාව හා වේදනාව පිරිමි දරුවන්ට යථාර්ථවාදී අයුරින් අවබෝධ කර දිය යුතුය. පුරුෂයින්ගේ සතුට වෙනුවෙන් නොව, ස්ත්‍රිය ද මේ ලෝකයේ පැවැත්ම සඳහා වූ අත්‍යවශ්‍ය හා ගෞරවණීය තැනැත්තියක් බව පසක් කර දිය යුතුය. එවිට සම්ප්‍රධාය අලුතින් ලිවීමටත්, අවිහිංසාවාදී සම්ප්‍රධායක් ගොඩනැගීමටත් හැකියාව ලැබෙනු ඇත.

ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයේ අරමුණු තාර්කික බවකින් තොර හා යල්පැනගිය පදනම් විරහිත හේතු බව අනාගත පරම්පරාවට ඒත්තුගැන්විය යුතුය. එංගලන්ත පාසල් දරුවන්ට පමණක් නොව, සෑම පාසලක් තුළින් ම සෑම දරුවෙක්ට ම මේ පිළිබඳ අවබෝධයක් කුඩා කළ සිට ම ලබා දෙන්නේ නම් ඔවුන් මෙම ක්‍රියාවලියට සම්බන්ධ නොවනවා සේම ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය නම් වූ අසාධාරණ ක්‍රියාවලියට විරුද්ධව තම මතය ක්‍රියාත්මක කරනු ඇත.

ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය හේතුවෙන් ලොවපුරා කාන්තාවන් හා ගැහැනු දරුවන් මුහුණපාන ගැටලු හා එහි බලපෑම් සමාජගත කළ යුතුය. බොහෝ විට මෙම ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ රහසිගතව වන අතර ඒ තුළ වන වේදනාවන් හා බලපෑම් කාන්තාවන්ට සමාජගත කිරීමට හැකියාව අහිමිවන්නේ තම සම්ප්‍රධාය හේතුවෙනි. මේ හේතුව නිසා ම ඔවුන්ගේ ගැටලු පර්යේෂණ හෝ සමීක්ෂණ මඟින් ගවේෂණය කර සමාජගත කිරීම මඟින් ඔවුන්ට වන බලපෑම පිළිබඳ සමාජය දැනුවත් වී ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹෙනු ඇත.

ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම හා ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම. ලොව පුරා ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනය අවම කිරීමට හා වැළැක්වීමට විවිධ පියවර ගෙන ඇති නමුත් මෙම ක්‍රියාවලියේ පහත බැසීමක් දක්නට නොලැබේ. ගෙන ඇති නීතිමය පියවරයන්ගේ දුර්වලතාවය ද ඊට හේතුවක් වී ඇත. මේ නිසා ම ස්ත්‍රීන්ගේ මූලික අයිතිවාසිකම් පවා උල්ලංඝනය කරනු ලබ ස්ත්‍රී ජනනේන්ද්‍රීය ඡේදනයට එරෙහිව ශක්තිමක් නීතිමය ක්‍රියාමාර්ග ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් එය අවම කිරීමේ හැකියාවක් ලැබෙනු ඇත.

ලොව පුරා කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට තම ශරීරය හා තම අයිතීන් සම්බන්ධයෙන් මනා දැනුමක් ලබා දිය යුතුය. මනුෂ්‍යයෙක් ලෙස උපත ලැබීම පමණක් තමාට මානව අයිතිවාසිකම් හිමිවීමට හේතුවක් වන බවත් එසේ හිමි වූ අයිතීන් අහිමිකර ගැනීමත් තම දරුවන්ට අහිමි කිරීමත් එම අයිතීන් උල්ලංඝනය කිරීමක් බවත් ඔවුන්ට වටහා දිය යුතුය. ස්ත්‍රී ජනනේන්ද්‍රීය ජේදනය සාපරාධී ක්‍රියාවක් බව දැඩිව පෙන්වා දෙමින් එසේ කිරීම තුළ හිමිවන දඩුවම් ශක්තිමත් කළ යුතුය. කුමන මතවාදී අදහසක් දරුව ද, රටක් තුළ මූලික නීතියට අවනත වීම, ජාත්‍යන්තර නීතියට අවනත වීම පුරවැසියෙකු ලෙස තමන්ගේ යුතුකමක් වන බව සියලු පුද්ගලයින්ට වැටහෙන ආකාරයට ඔවුන්ගේ ආකල්පමය සංවර්ධනය වැඩසටහන් තුළින් ක්‍රියාත්මක කළ යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අන්කුඹුර, එම්. (2006). *අස්පර්ෂ්‍ය සංස්කෘතික උරුමය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය.* එෆ්. ඊ. සී. ප්‍රකාශන, කොළඹ 04.

බින්සාලේ, එම්. (2008). *ඉස්ලාමයෙහි කාන්තාව.*

(2007). *ස්ත්‍රී චර්මඡේදනය : වාරිස් ඩයරි* [Online] Available: .https://adahasa.wordpress.com

(2017). *ස්ත්‍රී චර්මඡේදනය.*[Online] Available: https://saruwapittala.blogspot.com

(2017). *ස්ත්‍රී ප්‍රජනන අංග ඡේදනය පිළිබඳ ඉස්ලාමීය ස්ථාවරය.* [Online] Available: https://islaminivites.org.

(2018). *කාන්තා චර්මඡේදනය - දරුණු සම්ප්‍රධාය.* [Online] Available: https://si.atomiyme.com.

(2019). *කාන්තා සිරුරේ අයිතිය අහිමි කරන යෝනි සුන්නත එංගලන්ත පාසල් විෂය මාලාවට.* [Online] Available: https://bbc.com

(July 2019). *කාන්තා සිරුරේ අයිතිය අහිමි කරන යෝනි සුන්නත එංගලන්ත පාසල් විෂය මාලාවට.*[Online] Available: https://blog.hirutv.lk/news/12889

එදිනෙද ජීවිතය ගැන දැනගනිමු. (2019). *යෝනි සුන්නත ගැන දැනගනිමු.* [Online] Available: https://www.life.lk

සිල්වා. අයි. ඩී. (2018). *කාන්තා සුන්නත්කරණයේ බේදන්තය.*[Online] Available: https://roar.media/Sinhala/main/features/female-genital-mutilation

Grundmann, M. (2020). *Female genital mutilation feels like living in a dead body.* [Online] Available: https://amp.dw.com/en/female-genital-mutilation-feels-like-living-in-a-dead-body/a-52269987.

Mahakalusinhalaya. (April 2013). *ඉස්ලාමීය ස්ත්‍රී චර්මඡේදනය.*[Online] Available: .https://mahakalusinhalaya.wordpress.com.

Velj.(2019). *Female Genital Mutilation Four different types*. [Online] Available: https://m.facebook.com/BBCnewsAfrica/photos/its-estimated-one-in-20-girls-and-women-in-the-world-have-undergone-some-form-of/10157254087895229/?locale=hr_HR

Virtural Knowledge Center to End Violence against Women and Girls. (2011). *Sources of international human Rights law on Female Genital Mutilations.* [Online] Available: https://endvawnow.org